මුල් පිටුව
ඇතුළු පිටු
පුවත්
විශේෂාංග
කතුවැකිය
ප්‍රාදේශීය පුවත්
වෙළෙඳ
විදෙස් පුවත්
අපගේ වෙබ් අඩවි
The Island
විදුසර
නවලිය
Friendship / e-pal & Marriage
Sri Lanka General Elections 2004

පුවත්

# වනජීවී සංරක්ෂණය සඳහා විශිෂ්ට පූර්ණ සේවා සම්මාන ලබති



තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය මඟින් පවත්වන ලද "සේවා ප්‍රසාදිනී - 2017" සම්මාන උළෙල ලෝක වනජීවී දිනය යෙදුණු මාර්තු මස තුන්වැනිදා (03) පෙරවරුවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්විණි.

මෙහිදී වනජීවී සංරක්ෂණ, සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සහ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු තුන්වයේ සේවක සේවිකාවන් ඇගයුමට ලක්කරන ලද අතර, වනජීවී ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායකත්වය ලබාදුන් බාහිර ක්‍රියාකාරිකයන් ද ඇගයුමට ලක්කෙරිණි.

ඒ අතර පුවත්පත් මාධ්‍යවේදීන් දෙදෙනකු හා පරිසර හා වනජීවී ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයන් ද වූහ. මෙහිදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල ඇතුළු දෙසිය දෙනකු පමණ ඇගයුමට ලක්වූහ.

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතාගේ සංකල්පයකට අනුව පැවැත් වූ මෙම සම්මාන උළෙල සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ අතර අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා, එම නියෝජ්‍ය ඇමැතිනී සුමේධා

ජී. ජයසේන, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම් ආර්. එම්. ඩී. බී. මීගස්මුල්ල, වනජීවී උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන අධ්‍යක්ෂවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ. මෙහිදී "විශිෂ්ට පූර්ණ සේවා ප්‍රසාදිනී" සම්මාන ලාභීන් අතර, (පරිසර) නීතිඥ ජගත් ගුණවර්ධන, මාලක රොද්‍රිගු, ආචාර්ය සිරිල් විජේසුන්දර, වෛද්‍ය පෘථිවිරාජ් ප්‍රනාන්දු, වනජීවී නියෝජ්‍ය අධ්‍යක්ෂ රන්ජන් මාරසිංහ, ප්‍රවීණ සත්ත්වවේදී මෙන්ඩිස් වික්‍රමසිංහ, ඉසුර ද සොයිසා යන මහත්වරු 'දිවයින' කැමරාවට මුහුණ දුන් අයුරු ඡායාරූපයේ දැක්වේ.

මෙහිදී පුවත්පත් සඳහා වන සම්මාන ද්වය 'දිවයින' පුවත්පතේ ජගත් කණහැරආරච්චි සහ 'සන්ඩේ ටයිම්ස්' පුවත්පත වෙනුවෙන් මාලක රොද්‍රිගු යන මහත්වරුන් විසින් හිමිකරගන්නා ලදී.